**ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය - 2023**

**-----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයින් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය හා කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව.

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළ මෝටර් රථ ක්ෂය රු.31,270,600ක් වුවද, එය රු.139,750,600ක් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් වර්ෂයේ අතිරික්තය හා දේපළ පිරියත හා උපකරණවල ශුද්ධ අගය රු.108,480,000ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙම වරද ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | වර්ෂයට අදාළ ක්ෂය නිවැරදිව ගණනය කර ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ඇස්තමේන්තුගත පිරිවැය රු.13,737,637ක් වූ කර්මාන්ත 05ක වැඩ සමාලෝචිත වර්ෂය තුළ ආරම්භ කර තිබුණද 2023 දෙසැම්බර් 31 දිනට නිමි වැඩ වටිනාකම හඳුනාගෙන කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | මෙම කොන්ත්‍රාත් සඳහා කිසිදු බිල්පතක් මුදල් අංශයට ඉදිරිපත් වී නොතිබුණු බැවින් නිමි වැඩ වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත නොකරන ලද බව. | වර්ෂය අවසානයට නොනිමි වැඩ වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | වෛද්‍ය පීඨයේ පැරා සායනික ගොඩනැගිල්ල ඉදිකිරීමේ කර්මාන්තයහි මිල විචලනයන් වෙනුවෙන් ගෙවිය යුතු රු.42,935,892ක් ගිණුම්ගත කර නොතිබීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට නොනිමි වැඩ ශේෂය හා ප්‍රාග්ධන ණයහිමියෝ එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි. | අවසන් ගිණුම පිළියෙල කරන විට මෙම තොරතුරු මූලධන අංශය මඟින් මුදල් අංශයට ලබා දී නොතිබුණු බව. | වර්ෂය අවසානයට පවතින බැරකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුළදී පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.1,443,817ක් වටිනාකමැති පුස්තකාල පොත් ගිණුම්ගත කර නොතිබීම | මෙම වරද ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හේතුවෙන් හුවමාරු නොවන ගනුදෙනුවලින් වන ප්‍රාග්ධන අයහාරය හා ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ඉ) | විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන (STHRD) ව්‍යාපෘති අරමුදල්වලින් සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂ 04ක් තුළදී මිල දී ගෙන තිබුණු රු.889,535,859ක් වටිනාකමැති ජංගම නොවන වත්කම් ද, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 03 තුළ තාක්ෂණ පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් වැයකර තිබුණු රු.2,344,804,505ක් හා සමාලෝචිත වර්ෂය තුළ දරන ලද රු.91,235,422ක අයහාර වියදම්ද ගිණුම්ගත කර නොතිබුණි. | විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව STHRD ව්‍යාපෘතිය අවසන් වී විශ්වවිද්‍යාලයට අදාළ වත්කම් භාරදුන් පසු ශුද්ධ පොත් අගයට ගිණුම්ගත කරනු ලබන බව. | අභ්‍යන්තර ගිණුම්කරණ ප්‍රතිපත්ති සංශෝධනය කර වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | Restricted Funds මඟින් සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය තුළ මිල දී ගෙන තිබුණු රු.10,792,067ක් වටිනාකමැති වත්කම් ගිණුම්ගත කර නොතිබුණි. | විශ්වවිද්‍යාලයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව බාහිර ව්‍යාපෘති මඟින් මිලදී ගනු ලබන වත්කම්, අදාළ ව්‍යාපෘතිය අවසන් වී විශ්වවිද්‍යාලයට පවරාදීමෙන් අනතුරුව ශුද්ධ අගය පදනම් කරගෙන ගිණුම්ගත කරන බව. ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇති බව. | අභ්‍යන්තර ගිණුම්කරණ ප්‍රතිපත්ති සංශෝධනය කර වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ සටහන් 2 .4. 3. 2 හි අසම්භාව්‍ය වත්කම් යටතේ බැඳුම්කර ගිවිසුම් උල්ලංඝණය කළ නිලධාරින්ගෙන් අය විය යුතු ශේෂය හෙළිදරව් කිරීමේදී රු.21,929,907ක් වැඩියෙන් දක්වා තිබුණි. | අදාළ අංශය විසින් ලබාදුන් තොරතුරු මෙසේ ඉදිරිපත් කර ඇත. | තොරතුරු මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කළ යුතුය. |
| (ඌ) | ව්‍යවහාරික විද්‍යා පීඨයේ පැවති තොගයේ වටිනාකම ගණනය කිරීමේදී ඒකක පිරිවැය දෝෂ සහගත ලෙස යොදා ගැනීම හේතුවෙන් ඉතිරි තොග ශේෂය හා වර්ෂයේ අතිරික්තය රු.3,448,570ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙම වරද ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (එ) | AHEAD ව්‍යාපෘතියේ මූල්‍යාධාරවලින් 2023 දෙසැම්බර් මාසයේදී මිලදී ගෙන තිබූ රු.4,991,446ක් වටිනාකමැති ක්‍රීඩා උපකරණ ප්‍රාග්ධනිත කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනා නොගෙන | ක්‍රීඩා උපකරණවල ස්වභාවය පදනම් කරගෙන මෙලෙස දේපල පිරියත උපකරණ ලෙස වර්ගීකරණය කර නොමැති බව. | ක්‍රීඩා උපකරණ ගිණුම්ගත කිරීමට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන |

| | | | |
|---|---|---|---|
| | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ මෙහෙයුම් වියදම් යටතේ දක්වා තිබුණි. | | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) | සමාලෝචිත වර්ෂය අවසානයට ආයෝජන මත ලැබිය යුතු පොළී ආදායම රු.18,251,578ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරියේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඔ) | සමාලෝචිත වර්ෂය තුළදී දේපළ පිරියත හා උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් හා නොනිමි වැඩ වෙනුවෙන් ගෙවිය යුතු පිළිවෙලින් රු.1,375,860ක් හා රු.855,277ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | උපචිත වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඕ) | ඕස්ට්‍රේලියානු විශ්වවිද්‍යාලයකින් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු මිනුම් උපකරණ රේගුවෙන් නිදහස් කර ගැනීම සඳහා ගෙවා තිබුණු බදු හා ගාස්තු රු.1,949,733ක් මෙහෙයුම් වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර එම උපකරණවල වටිනාකම රු.8,027,127ක් ගිණුම්ගත කර නොතිබුණි. එමනිසා වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු.1,949,733කින්, හුවමාරු නොවන ගනුදෙනුවලින් වන ප්‍රාග්ධන අයභාරය රු.8,027,127කින් හා දේපළ පිරියත හා උපකරණ ශේෂය රු.9,976,859කින් අඩුවෙන් දැක්වුණි. | විශ්වවිද්‍යාලයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව බාහිර ව්‍යාපෘති සඳහා පරිත්‍යාග ලෙස ලැබුණු වත්කම් අදාළ ව්‍යාපෘති අවසානයේදී විශ්වවිද්‍යාලයට ලබාදීමෙන් අනතුරුව ශුද්ධ පොත් අගය පදනම් කරගෙන ගිණුම්ගත කරනු ලබන බැවින් මෙම වත්කම් ගිණුම්ගත කර නොමැත. මේ සම්බන්ධයෙන් හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර ඇති බව. | අභ්‍යන්තර ගිණුම්කරණ ප්‍රතිපත්ති සංශෝධනය කර වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ක) | 2023 වර්ෂයේ දෙසැම්බර් මාසය සඳහා ගෙවිය යුතු අනියම් සේවක වැටුප් රු.8,037,080ක් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වර්ෂයේ අතිරික්තය වැඩියෙන් හා උපචිත පුනරාවර්තන වියදම් අඩුවෙන් දක්වා තිබුණි. | අතපසුවීමකින් ගිණුම්ගත වී නොමැත. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | වර්ෂය අවසානයට උපචිත වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ග) | ඉකුත් වර්ෂයේ හිඟ ජල ගාස්තු වෙනුවෙන් ගෙවන ලද රු.6,000,000ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා එම ප්‍රමාණයෙන් වර්ෂයේ අතිරික්තය අඩුවෙන් හා සමුච්චිත අරමුදල වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ච) | LEARN ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු වියදම් රු.15,880,186ක් වුවත්, එය රු.14,723,259ක් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් රු.1,156,927කින් වර්ෂයේ අතිරික්තය වැඩියෙන් හා ජංගම බැරකම් අඩුවෙන් දැක්වුණි. | අවසන් මාස දෙකෙහි වෛද්‍ය පීඨයට අදාළ බිල්පත් උපචිත නොකිරීම නිසා මෙම වෙනස හට ගෙන ඇත. නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | වර්ෂය අවසානයට උපචිත වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ජ) | විශ්වවිද්‍යාලය සතුව රු.517,094,762ක් වටිනා අරමුදල් පැවතුණද සමාලෝචිත වර්ෂය අවසානයට මුදල් සහ බැංකු තැම්පතුවල වටිනාකම රු.443,317,793ක් වීමෙන් රු.73,776,969ක වෙනසක් පැවැතුණි. | විශ්වවිද්‍යාලය සතුව පවතින අරමුදල් තුළ ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම්වල අතිරික්තය අදාළ අරමුදල් තුළට බෙදාහැරීමේ දී ඒ තුළ ලැබිය යුතු ආදායම් මඟින් ජනිත ආදයමින් වන අතිරික්තයන්ද ගිණුම් තුළ පෙන්නුම් කරනු ලැබේ. එබැවින් අරමුදල්වල වටිනාකමට සමාන වීමක් සිදු නොවන බව. | විශ්වවිද්‍යාලය සතුව පවතින අරමුදල් ශේෂයන් මුදල් සහ බැංකු තැම්පතුවල වටිනාකම සමග සැසඳීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය හා 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 03 ඡේදය මඟින් හඳුන්වා දී ඇති මෙහෙයුම් අත්පොතේ 6.2 ඡේදය | අදාළ අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ රු.168,028,508ක් ස්ථාවර තැන්පතු 14ක ආයෝජනය කර තිබුණි. | විෂයභාර අමාත්‍යවරයාගේ සහ මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීම සඳහා අදාළ ලිපි යැවීමට කටයුතු කරන බව. | මුදල් පනත හා චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 282, 290 හා 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ (xvii) ඡේදය | වැටුප් සහ දීමනා ගෙවීම් සඳහා රු.2,017,000,000ක අග්‍රිම ලැබී තිබුණ ද, වර්ෂයේ වියදම රු.1,953,840,000ක් වූයෙන් රු.63,160,000ක් වෙනත් වියදම් වෙනුවෙන් වැයකර තිබුණි. | විශ්වවිද්‍යාලයට වෙනත් පුනරාවර්තන වියදම් සඳහා ලැබෙන ප්‍රතිපාදනවල ඌනතාවයන් හේතුවෙන් දැරිය යුතු අත්‍යාවශ්‍ය වියදම් සඳහා එම අතිරික්ත මුදල වැය වී ඇති බව. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 371(2)(ආ) | අතුරු අග්‍රිම ලබාදිය හැකි රු.100,000ක් වූ උපරිම සීමාව ඉක්මවා අවස්ථා 19ක දී එකතුව රු.8,526,423ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. තවද අවස්ථා 15ක දී එකතුව රු.2,436,685ක් වූ අත්තිකාරම් මාණ්ඩලික තත්ත්වයේ නොවන නිළධාරීන් වෙත නිකුත් කර තිබුණි. | වර්තමානයේ පවතින ආර්ථික දුෂ්කරතා හේතුවෙන් බොහෝ සැපයුම්කරුවන් ණයට භාණ්ඩ සැපයීම සීමා කර ඇත. එම නිසා, අත්තිකාරම් මුදල් ගෙන, භාණ්ඩ මිලදී ගැනීමට සිදුවී ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | මුදල් රෙගුලාසි 571 | එකතුව රු.13,616,332ක් වූ පුස්තකාල සහ පරික්ෂණාගාර තැම්පතු වලින් නියමිත කාලය සම්පූර්ණ වූ තැම්පතු හඳුනාගෙන නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | කාලය සම්පූර්ණ තැන්පතු නියාදනය කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 7 ඡේදය | (i) 2000 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී, අධ්‍යයන නිවාඩු ලබා විදේශගත වී තිබුණු නිලධාරීන් 13 දෙනෙකුගෙන් බැඳුම්කර කඩකිරීම හේතුවෙන් අයකරගත යුතු රු.92,299,644ක් 2024 අප්‍රේල් වන විටත් අයකරගෙන නොතිබුණි. | මෙම ශේෂයන් අයකර ගැනීම සඳහා 09 දෙනෙකුට එරෙහිව නීතිමය පියවර ගැනීමට කටයුතු කර ඇත. එමෙන්ම, ප්‍රධාන පැහැර හරින්නන් හා ඇපකරුවන් වෙත සිහිකැඳවීම් ලිපි යොමු කිරීමට ද කටයුතු කර ඇති බව. | උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | | (ii) වර්ෂ 2015 සිට වර්ෂ 2023 කාල පරිච්ඡේදය තුලදී වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා විදේශගත වූ නිලධාරීන් 05 දෙනෙකු හා දේශීය අධ්‍යයන නිවාඩු ලබාගත් නිලධාරීන් 03 දෙනෙකු අදාල කාලය තුළ අධ්‍යයන කටයුතු නිම නොකර නැවත සේවයට වාර්තාකර තිබුණි. අදාල ගිවිසුම අනුව අධ්‍යයන කටයුතු සම්පූර්ණකර නොමැති නම් ඒ සඳහා දරන ලද සියලු වියදම් අයකළ යුතු වුවත්, 2024 අප්‍රේල් | අධ්‍යයන නිවාඩු ලබා විදේශ ගත වූ නිලධාරීන් දෙදෙනෙකු උපාධිය සම්පූර්ණකර අදාළ සහතික ලබා දී ඇත. තවත් දෙදෙනෙකු වෙත බන්ධනගත අලාභය ගෙවන ලෙස දැනුම් දී ඇත. | උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | වන විටත් රු.66,698,316ක් අයකරගෙන නොතිබුණි. | | |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ ii පරිච්ඡේදයේ 13.7 ඡේදය හා විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ iii පරිච්ඡේදයේ 23.3.8 ඡේදය | මූල්‍යාධිකාරී තනතුරෙහි රාජකාරී ආවරණය සඳහා පත්කළ නිලධාරියකු වෙත 2020 අගෝස්තු 07 දින සිට 2022 ජූලි 31 දින දක්වා හා 2023 අප්‍රේල් 18 සිට 2023 ජූලි 17 දක්වා කාලය වෙනුවෙන් වැටුපෙන් සියයට 10 ක දීමනාව ඇතුළුව ප්‍රවාහන දීමනා, ඉන්ධන දීමනා හා සංග්‍රහ දීමනා වශයෙන් එකතුව රු.1,344,647ක් ගෙවා තිබුණි. එමෙන්ම, 2021 අප්‍රේල් සිට ජූලි දක්වා ලේඛකාධිකාරී තනතුරේ රාජකාරී ඉටුකිරීම සඳහා පත්කර තිබුණු නිලධාරියකු වෙත ප්‍රවාහන දීමනා, ඉන්ධන දීමනා හා සංග්‍රහ දීමනා වශයෙන් එකතුව රු.331,038ක් ගෙවා තිබුණි. | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ III වන පරිච්ඡේදයේ 22:2.7 අනුව වැඩ බැලීමේ පත්වීම් ලබාදී ඇත. ඒ අනුව වැඩ බැලීමේ වැටුප් ගෙවා ඇත. අදාළ නිලධාරීන් දෙදෙනා විශ්වවිද්‍යාලයේ සේවය සඳහා පැමිණීමේ දී හා සේවයෙන් පිටව යාමේ දී පවත්වා ගත යුතු රාජකාරී රහස්‍යභාවයන් පවත්වාගෙන යාම සඳහා ප්‍රවාහන සහ ඉන්ධන දීමනා ලබා දීම යෝග්‍ය බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | | | |
| (i) | 4.5 ඡේදය | වටිනාකම රු.73,635,450ක් වූ ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් 11ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | විශ්වවිද්‍යාලයට කිසිම මූල්‍යමය ප්‍රතිලාභයක් සම්පාදනය නොවන නිසා ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් යටතට ගනු නොලබන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | 5.2.3 ඡේදය | ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම්වලට ඍජුව හෝ වක්‍රව සම්බන්ධ වන කාර්යය මණ්ඩල සාමාජිකයින්ට ගෙවීම් කටයුතු සඳහා වෙන් කළ යුතු රු.131,804,887ක් විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේ (CODL) සංවර්ධන අරමුදල හා පශ්චාත් උපාධි අධ්‍යයන පීඨ (FGS) සංවර්ධන අරමුදල තුළ රඳවා තිබුණි. එහෙත් එම | CODL හා FGS ස්ථිර කාර්ය මණ්ඩලයට ද විශ්වවිද්‍යාලයේ අනෙකුත් ස්ථිර කාර්ය මණ්ඩලයට මෙන් වාර්ෂික අයවැයෙන් පුනරාවර්ථන වැය ශීර්ෂයේ වැටුප /දීමනා ගෙවා ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ආයතනවල සේවයේ නියුතු විශ්වවිද්‍යාලීය කාර්යය මණ්ඩලය වෙත විශ්වවිද්‍යාල අරමුදලෙන් රු.13,469,000ක් පමණ වාර්ෂිකව වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. | | |
| (iii) | 5.3 ඡේදය | විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය හා පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය මඟින් සංවර්ධන වැය විෂයයන් සඳහා වෙන් කරන ලද රු.58,490,528ක් විශ්වවිද්‍යාල අරමුදලට බැර නොකර එම පීඨවල සංවර්ධන අරමුදල් තුළ රඳවාගෙන තිබුණි. | ස්වයං මූල්‍ය කටයුතු විමධ්‍යගතව සිදුකිරීම නිසා සංවර්ධිත වැය ශීර්ෂවල උපචිත පදනමට ගලපන ලද වෙන් කිරීම් විශ්වවිද්‍යාලයට මුදලින් බැර නොකර සංවර්ධිත වැය ශීර්ෂ මඟින් වියදම් දැරීම සිදු කරනු ලබන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2019 නොවැම්බර් 25 දිනැති අංක 09/2019 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | | | |
| (i) | 1 (i) වගන්තිය | රජයේ නිවාස 38 ක පදිංචි නිලධාරීන් 38 දෙනෙකුගෙන් 2019 දෙසැම්බර් සිට 2023 ජූලි දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව එකතුව රු.8,043,695ක් අඩුවෙන් නිවාස කුලිය අයකර තිබුණි. එමෙන්ම, නිලධාරීන් 08 දෙනෙකුගෙන් 2019 දෙසැම්බර් සිට 2023 දෙසැම්බර් දක්වා කාල සීමාව තුළ එකතුව රු.2,933,611ක් වූ නිල නිවාස කුලී අයකර නොතිබුණි. | මෙම චක්‍රලේඛයට අනුව සුදුසුකම්ලත් නිලධාරීන් වන්නේ පත්වීම් ලිපියේ නිල නිවාසයකට හෝ නිල නිවාසයක් සඳහා වන දීමනාවකට හිමිකම් ලබන බවට සඳහන් නිලධාරීන් වුවත් මෙම විශ්වවිද්‍යාලයේ නිලධාරීන්ගේ පත්වීම් ලිපි කිසිවක එවැනි සඳහනක් නොමැත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (උ) | 2018 නොවැම්බර් 26 දිනැති අංක 15/2018 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | යම් කාර්යය මණ්ඩල රක්ෂණ යෝජනා ක්‍රමයක සේවා දායකත්වය භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් වැය කළ නොහැකි වුවද, 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුළ රු.1,283,078ක් භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් වැයකර තිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අංක 718 චක්‍රලේඛය අනුව කටයුතු කර ඇත. | දැනට වලංගුව පවතින චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඌ) | 2013 මැයි 14 දිනැති අංක 08/2013 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | මෙරට රැකියාවක නිරතවීම සඳහා සප්ත වාර්ෂික නිවාඩු ලබා ගෙන තිබුණු ආචාර්යවරියක් එම නිවාඩු කාලය අතුරතුර පෞද්ගලික විදේශ සංචාරයක නිරතවීම සඳහා යාන පත්‍ර ලබා ගැනීම වෙනුවෙන් දරන ලද රු.330,000ක මුදල ලබාදීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ප්‍රතික්ෂේපකර තිබුණද සංචාරයෙන් වසරකට පමණ පසුව ඉදිරිපත් කර තිබුණු අභියාචනය සළකා බලා පාලක සභා අනුමැතිය මත විශ්වවිද්‍යාලය විසින් එම මුදල ප්‍රතිපූර්ණය කර තිබුණි. | චක්‍රලේඛ අංක 08/2013 ප්‍රකාරව සප්ත වාර්ෂික නිවාඩු කාලය තුළ සිදු කරන පෞද්ගලික විදේශ සංචාර සඳහා යාන පත්‍ර ලබාදිය නොහැකි බව වි.වි.ප්‍ර.කො. සභාව මුල් අවස්ථාවේදී දන්වා තිබුණ ද, ඉදිරිපත් කර තිබුණු අභියාචනය සලකා බලා විශ්වවිද්‍යාල පාලක සභාවට තීරණයක් ගන්නා ලෙස පසුව දන්වා තිබුණු බැවින් ප්‍රතිපූර්ණය කිරීමට අනුමැතිය ලබා දී ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.505,333,576ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.381,445,894ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.123,887,682ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ප්‍රදාන රු.270,000,000කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලීය අධ්‍යයන කාර්යය මණ්ඩලය දිනපතා පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍රයේ හෝ පැමිණීමේ ලේඛනයක සටහන් කිරීම සිදු නොකළ ද, අධ්‍යයනාංශ මඟින් පවරා ඇති කාලසටහන් නිම කිරීමේ ප්‍රගතිය, දේශන සටහන් පොත් (Lecture record book) මඟින් තහවුරුකරගත හැකි බව උපකුලපතිවරයා විසින් ඉකුත් වර්ෂයේදී විගණනය වෙත දන්වා තිබුණි. එහෙත්, විගණනයට ලක් වූ 2022 ජනවාරි සිට 2023 ජූලි දක්වා කාලපරිච්ඡේදය තුළ ව්‍යවහාරික විද්‍යා පීඨයේ අධ්‍යයනාංශ 04හිම දේශන සටහන් පොත් යාවත්කාලීනව නඩත්තුකර නොතිබුණි. දේශන සටහන් පොත් යාවත්කාලීන කර නොමැති අවස්ථාවල දී ශිෂ්‍යයින්ගේ පැමිණීමේ ලේඛන මඟින් | ව්‍යවහාරික විද්‍යා පීඨයේ අධ්‍යයනාංශවල දේශන සටහන් පොත් පවත්වාගෙන යනු ලැබුවද අදාළ කාලවකවානුව තුළ දේශන මාර්ගගත ක්‍රමය යටතේ පැවැත්වීමට කටයුතු කළ නිසා දේශන සටහන් පොත් යාවත්කාලීන කිරීමට අපහසු වී ඇත. නමුත් මේ වන විට දේශන සටහන් පොත් යාවත්කාලීන කිරීමට කටයුතු සිදුකර ඇති බව. | අධ්‍යයන කාර්යය මණ්ඩලය වෙනුවෙන් වැටුප් හා දීමනා ගෙවීමේදී ඔවුන් විසින් ඉටුකරන ලද සේවාව තහවුරුකර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දේශකවරයාගේ පැමිණීම හා දේශන පැවැත්වීම පිළිබඳ තහවුරුවක් ලබා ගත හැකි වුවද, අධ්‍යයනාංශ 03ක සිසුන්ගේ පැමිණීමේ ලේඛන අදාළ අධ්‍යයනාංශවල ගොනුගතකර නොතිබීමෙන් එම තහවුරුව ද ලබා ගත නොහැකි විය. | | |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්තමානයේ භාවිතා කෙරෙන ගෘහස්ථ කොම්පෝස්ට් බඳුන, මහා පරිමාණ නිෂ්පාදන ආකෘතියක් ලෙස වෙළඳපොළට හඳුන්වාදීම හා ඉහළ ගුණත්වයකින් යුතු සත්ත්ව ආහාර හා කාබනික පොහොර වාණිජ මට්ටමින් නිෂ්පාදනය කිරීම අරමුණු කරගත් පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය වේගවත් කිරීමේ (AHEAD) ලෝක බැංකු ණය ආධාර යටතේ රු.50,000,000ක් වැය කර තිබුණි. එහෙත් නිපදවා තිබුණ මහා පරිමාණ කොම්පෝස්ට් බඳුන සඳහා ශ්‍රී ලංකා බුද්ධිමය දේපළ කාර්යාලය විසින් දන්වා තිබුණු නිර්ණායක සම්පූර්ණ කිරීමට කටයුතුකර නොතිබීම නිසා එම ඒකකය සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කෙරෙන කීට වගා ඒකකය (Harvesting Unit) ද වාණිජකරණය කිරීමට නොහැකි වී තිබුණි. එමෙන්ම, එම කීටයින් මඟින් සැකසූ ආහාර හා එම ආහාර සැකසීමේ තාක්ෂණික ක්‍රමය සඳහා පේටන්ට් බලපත්‍රයක් අයදුම් කර තිබුණද තාක්ෂණික ක්‍රමයේ පැවති දුර්වලතා හේතුවෙන් එම අයදුම්පත්‍රය ද ප්‍රතික්ෂේප කර තිබුණි. අදාළ නිර්ණායක සම්පූර්ණකර අපේක්ෂිත ප්‍රතිඵල ලඟාකර ගැනීමට කටයුතුකර නොතිබීමෙන් දරන ලද වැය නිෂ්ඵල වී තිබුණි. | පර්යේෂණ ප්‍රතික්ෂේප වීම සාමාන්‍ය දෙයකි. තාක්ෂණික හේතු නිසා පමණක් එය සිදු නොවේ. ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය විසින් 2023 ජූනි 02 වැනි දින අදාළ පේටන්ට් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබුවද, එම ලිපියේ සඳහන් පරිදි අදාල අයදුම්පතට තවදුරටත් සංශෝධන ඇතුලත් කළ හැකි වේ. ඒ අනුව අදාළ සංශෝධන ක්‍රියාවලිය මේ මොහොතේ සිදු වෙමින් පවතින බව. | වැයකළ මුදලට ප්‍රමාණවත් ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහා අදාළ නිර්ණායක සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ERASMUS ව්‍යාපෘති ප්‍රතිපාදන යටතේ ක්‍රීඩා උපකරණ සඳහා රු.2,156,500ක් (යූරෝ 9,500ක්) වෙන්කර තිබුණු අතර, ඉන් රු.1,362,000ක් ආබාධිත ක්‍රීඩා උපකරණ සඳහා වෙන්කර තිබුණි. ආබාධිත ක්‍රීඩා උපකරණ කිසිවක් මිලදී ගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ අනුමත ප්‍රතිපාදනය ඉක්මවා රු.124,498ක් වැය කර තිබුණි. | ආබාධිත ක්‍රීඩා උපකරණ සඳහා මිල ගණන් එවා නොමැති අතර මිල ගණන් එවන ලද භාණ්ඩ පමණක් මිලදී ගැනීමට කටයුතු කරන ලද බව. | ව්‍යාපෘති ගිවිසුම හා අනුමත අයවැය ප්‍රතිපාදන අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2019/2020 අධ්‍යයන වර්ෂයට ව්‍යවහාරික විද්‍යා පීඨයේ අධ්‍යයනාංශ 04 සඳහා සිසුන් 176 දෙනෙකු ලියාපදිංචි වී තිබුණු අතර, එම සිසුන්ගේ පළමු වසර පළමු සමාසිකයේ දේශන 2019 සැප්තැම්බර් 13 වන දින මාර්ගගත (Online) ක්‍රමයට ආරම්භ කර තිබුණි. ප්‍රායෝගික පරීක්ෂණ හා විභාග සඳහා එම සිසුන් 2022 හා 2023 වර්ෂයේ දින කිහිපයක් පමණක් විශ්වවිද්‍යාලයට කැඳවා තිබුණු අතර, අධ්‍යයන කටයුතු සඳහා ලියාපදිංචි වී වසරකුත් මාස 10ක් එනම් පාඨමාලා කාලසීමාවෙන් හරි අඩක්ම මාර්ගගත ක්‍රමයට දේශන පවත්වා තිබීමෙන් එම ශිෂ්‍ය කණ්ඩායමට විශ්වවිද්‍යාලය තුළට පැමිණ අධ්‍යයන කටයුතු කිරීමට ඇති අවස්ථාව අහිමි වී තිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපදෙස් පරිදි වැඩි සිසුන් ප්‍රමාණයක් බඳවා ගත්තද එම ප්‍රමාණයට සරිලන භෞතික සම්පත් ලබා දීමක් සිදුව නොමැත. එමනිසා නේවාසිකාගාර, දේශන ශාලා හා අනෙකුත් පහසුකම් සම්බන්ධයෙන් දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ දෙමින් අධ්‍යයන කටයුතු පවත්වාගෙන යනු ලබයි. එබැවින් 2019/2020 අධ්‍යයන වර්ෂයට අදාළ සිසුන් මාර්ගගත ක්‍රමය යටතේ අධ්‍යයන කටයුතු සිදු කලද මේ වන විට විශ්වවිද්‍යාල තුළ දේශන වලට සහභාගි වීම සඳහා අවස්ථාව සලසා දීමට කටයුතු කර ඇති බව. | සියළුම ශිෂ්‍යයින්ට විශ්වවිද්‍යාලය තුළට පැමිණ අධ්‍යයන කටයුතු කිරීමට අවස්ථාව සලසා දිය යුතුය. |
| (ඈ) | 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ පර්යේෂණ කාල සීමාව අවසන්කර තිබුණු පර්යේෂණ 10ක් සඳහා ප්‍රදාන ලෙස රු.20,798,126 ගෙවා තිබුණද, 2024 මාර්තු 25 දින වන විටත් අවසන් පර්යේෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | පර්යේෂණ ප්‍රදාන ලබාදුන් පර්යේෂණ ව්‍යාපෘති 10ක අවසන් වාර්තා ලැබීමට නියමිත බව. | අවසන් පර්යේෂණ වාර්තා ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3 අවිධිමත් ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | Building Resilience Tropical Agro Eco systems (BRITAE) ව්‍යාපෘතියේ ප්‍රතිපාදන මඟින් 2022 වර්ෂයේදී පුහුණුවක් සඳහා විදේශගත වූ නිලධාරින් 04 දෙනෙකු වෙත වැඩිපුර යවා තිබුණු රු.1,210,518ක යැපුම් දීමනා හා ගමන් වියදම් වාර්තාවේ දින දක්වාම අයකරගෙන නොතිබුණි. | මෙම මුදල් අයකර ගැනීමට මේ වන විටත් කටයුතු කරමින් පවතින බව . | වැඩිපුර ගෙවා ඇති මුදල ආපසු අයකර ගත යුතුය. |
| (ආ) | සබරගමුව විශ්වවිද්‍යාලයෙන් සප්ත වාර්ෂික නිවාඩු ලබාගෙන 2022 මාර්තු 02 දින සිට වසර 01 මාස 08ක කාලයක් කොළඹ විශ්වවිද්‍යාලයේ කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ අධ්‍යක්ෂ තනතුරේ රාජකාරිකර තිබුණු ආචාර්යවරයෙකු වෙත සබරගමුව හා කොළඹ විශ්වවිද්‍යාලවලින් අධ්‍යයන දීමනා (Academic Allowance) ලෙස පිළිවෙලින් එකතුව | පාලක සභා අනුමැතිය පරිදි ඔහුගේ වැටුප සහ එම වැටුපට අදාළ දීමනා ලබා දී ඇති බව. | නිලධාරියකු වෙත එකම කාලපරිච්ඡේදයක් වෙනුවෙන් එකම දීමනාව දෙවරක් ගෙවීම නිර්දේශ කළ නොහැක. |

රු.3,232,548ක් හා රු.3,605,901ක් ගෙවා තිබුණි.

## 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආසියානු සංවර්ධන බැංකු (ADB) ණය යටතේ ක්‍රියාත්මක විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (STHRD) මගින් 2021 වර්ෂය තුළ තාක්ෂණ පීඨය සඳහා පුස්තකාල පොත් මිලදී ගැනීමේදී, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල නොවී පූර්ව අත්දැකීම් රහිත සැපයුම්කරුවෙකු තෝරාගෙන සමස්ත ප්‍රසම්පාදනයෙන් සියයට 76ක් හෙවත් රු.20,200,200ක් වූ වටිනාකමකට පොත් වර්ග 118කට අයත් ඒකක 421ක් මිල දී ගෙන තිබුණි. ඉන් රු.7,596,400ක් වටිනා පොත් වර්ග 33කට අයත් ඒකක 114ක් පෙර පරිහරණය කළ පොත් (used book) විය. එමෙන්ම, රු.6,922,982ක් වැයකර විෂයය නිර්දේශවලට අදාළ නොවූ පොත් වර්ග 69කින් ඒකක 179ක් මිලදී ගෙන තිබුණි. මෙම ප්‍රසම්පාදනයේදී, අන්තර්ජාතික වෙළඳපොළ තුළ පැරණි හා නව පොත් අලෙවිවන අවම මිල ගණන් වලට සාපේක්ෂව පොත් වර්ග 63කින් ඒකක 227ක් වැඩි මිලකට මිලදී ගැනීම නිසා රු.12,116,310ක මූල්‍යමය පාඩුවක් සිදු වී තිබුණි. | 2024 අප්‍රේල් 30 දිනැති 307 වන පාලක සභාවේ නිර්දේශය මත එම විෂය පිළිබඳ දැනුමක් සහිත බාහිර ස්වාධීන විමර්ශකයෙකු පත්කර විධිමත් ස්වාධීන විමර්ෂණයක් සිදු කරනු ලබන බව. | පරීක්ෂණ කඩිනම්කර වගකිව යුතු පුද්ගලයන් සඳහා විනයානුකූලව කටයුතු කර සිදුවී ඇති අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.5 නිෂ්කාර්යය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සිසුන්ගේ ප්‍රායෝගික කුසලතා වැඩි දියුණු කිරීම , ගොවීන් හා කුඩා/මධ්‍ය පරිමාණ කෘෂි ව්‍යාපාරිකයින් සමග බිම් මට්ටමේ සිට ක්‍රියාකාරකම් සිදුකිරීම හා සිසුන්ගේ හා කාර්යය මණ්ඩලයේ ක්ෂේත්‍ර දැනුම වර්ධනය කිරීමේ අරමුණින්, උසස් අධ්‍යාපනය කඩිනම් කිරීමේ සහ සංවර්ධනය වේගවත් කිරීමේ (AHEAD) ව්‍යාපෘතියේ ප්‍රතිපාදන මත 2021 පෙබරවාරි 24 දින රු.13,895,000 වැයකර මිලදී ගෙන තිබුණු ජංගම විද්‍යාගාර බස්රථය 2021 මාර්තු සිට 2023 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ අවස්ථා 06ක දී පමණක් අධ්‍යයන කටයුතු සඳහා භාවිතාකර තිබීමෙන් ඌන උපයෝජිතව පැවතුණි. | මෙම බස් රථය මේ වන විට කෘෂි විද්‍යා පීඨයේ හා අනෙකුත් පීඨවල සිසුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා යොදා ගනු ලබන බව. | වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |

### 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වෛද්‍ය පීඨයේ රසායනාගාර පරීක්ෂණ සඳහා අත්‍යාවශ්‍ය රසායනික ද්‍රව්‍ය ඇතුළු අනෙකුත් ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් වූ රු.13,662,588ක ප්‍රසම්පාදන කාර්යයන් 06ක් සමාලෝචිත වර්ෂය තුළ අතරමග නවතා තිබුණි. කඩිනමින් ලබාදෙන ලෙස ඉල්ලීම්කර තිබියදීත්, වර්ෂය අවසාන වන විටත් ඒවා මිලදීගෙන නොතිබීම වෛද්‍ය පීඨ සිසුන්ගේ ප්‍රායෝගික පරීක්ෂණ සඳහා අහිතකර ලෙස බලපා තිබුණි. | ප්‍රතිපාදන සීමාවීම නිසා මෙම ප්‍රසම්පාදන සහ ඇණවුම් ප්‍රමාද කර ඇති බව. | අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය සම්පත් අප්‍රමාදව ලබා දීමට කටයුතු කළ යුතුය. |

### 3.8 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ කර්මාන්තය සඳහා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු.63,010,287ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබියදී, කොන්ත්‍රාත්කරු කර්මාන්තය අතරමග අතහැර දමා තිබුණි. එහෙත් රු.72,461,830ක් වූ (වැට් සහිත) අත්තිකාරම් බැඳුම්කර කල් ඉකුත් වීමට පෙර මුදල්කර නොගැනීම නිසා අත්තිකාරම් මුදලින් රු.28,809,334ක් පියවා ගැනීමට නොහැකි වී තිබුණි. | අදාළ අත්තිකාරම් බැඳුම්කරය දීර්ඝ කිරීමට කටයුතු කරන ලෙස 2020 ජනවාරි 13 දිනැති ලිපිය මඟින් මූලධන හා සැලසුම් අංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරිය එම ආයතනය වෙත දන්වා යවා ඇත. එමෙන්ම 2020 පෙබරවාරි 17 දිනැතිව එවකට සිටි ලේඛකාධිකාරිතුමාගේ අත්සන සහිත ලිපියකින් නැවත සිහිකැඳවීමද යවා ඇත. එහෙත් බැංකුව විසින් අත්තිකාරම් බැඳුම්කරය දීර්ඝ කිරීම ප්‍රතික්ෂේප කර ඇත. | අත්තිකාරම පියවා ගැනීමට කටයුතු කළයුතු අතර කොන්ත්‍රාත් පරිපාලනය විධිමත් කළ යුතුය. එමෙන්ම, අදාළ නිලධාරීන්ට ප්‍රසම්පාදන කටයුතු හා කොන්ත්‍රාත් පරිපාලනයට අදාළ නීති රීති පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ලබා දීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාලයේ කාර්යය මණ්ඩලය සඳහා නිවාස සංකීර්ණයක් ඉදිකිරීමේ කර්මාන්තයේදී Powder Coated Aluminium හා Cladding භාවිතයෙන් නිමකළ යුතු දොරවල් 370ක් Plywood වලින් යොදා තිබුණු අතර දොරවල් 316ක Door Closers සවිකර නොතිබුණි. එසේ තිබියදී, මිල යෝජනාව (price proposal) තුළ නිවාස ඒකකයක් සඳහා එකවර මුදලක් (Lump sum) ලෙස අනුමත කර තිබුණු මුළු වටිනාකමම ගෙවා | කොන්ත්‍රාත් සමාගම විසින් ඉදිරිපත්කර ඇති යෝජනාවලියේ Door closer සවි කරන බවට යෝජනා කර නැත.<br>ක්ෂේත්‍රයේ නිපුණත්වය ඇති ප්‍රමාණ සමීක්ෂකවරයකු මඟින් ඇලුමිනියම් දොරවල් හා ප්ලයිවුඩ් දොරවල් අතර මූල්‍යමය වෙනස ගණනය කර එය කොන්ත්‍රාත්කරුගෙන් අය කර ගැනීමට විශ්වවිද්‍යාලය පියවර ගනිමින් ඇති බව. | නිර්මාණය කර ගොඩනැගීමේ (design & built) කොන්ත්‍රාත්තුවලදී අනුමත පිරිවැය හා සැලසුම් සංශෝධනය නොකළ යුතුය. |

තිබීමෙන් රු.13,936,750ක අලාභයක් සිදු වී තිබුණි. එමෙන්ම, කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු අවසන් බිල්පත අනුව වැඩ විෂයයන් 03ක් සඳහා කොන්ත්‍රාත්කරු විසින් ඉටු නොකළ හා ඔහු විසින් ඉල්ලුම් නොකළ රු.2,600,000ක් ද වැඩ ඉංජිනේරුගේ සහතිකය මත ගෙවීම් කර තිබුණි.

රු.2,600,000ක් ගෙවා ඇත්තේ අවසන් කරන ලද වැඩ සඳහා පමණි. කොන්ත්‍රාත් සමාගම මඟින් ඉදිරිපත් කරන ලද අවසන් බිල්පතෙහි පැවති දෝෂ සහගත තත්ත්වයක් හේතුවෙන් මෙම තත්ත්වය ඇති වී ඇති බව.